# ග්‍රාමීය සේවා වියුක්තිය හා ස්වයං රැකියාව (වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන් )

එච්.ඒ.ටී.හෙට්ටිආරච්චි[1]

රටක සේවා වියුක්ති අනුපාතය වැඩිවීම එම රටෙහි ආර්ථික වර්ධනය හා සංවර්ධනය කෙරෙහි ඍජුවම බලපානු ලබයි. ශ්‍රී ලංකාවේ සමස්ථ සේවා වියුක්ති අනුපාතය 4.4% (2013) ක් වන අතර එය ග්‍රාමීය අංශය තුළ 4.2% (2013) ක අගයක් පෙන්නුම් කරනු ලබයි. ඒ අනුව ග්‍රාමීය වශයෙන් පවතින සේවා වියුක්තිය අවම කර ගැනීමට යොදා ගැනුනුඑක් උපාය මාර්ගයක් ලෙස ස්වයං රැකියා අවස්ථා හඳුන්වා දිය හැකිය. මෙම අධ්‍යයනය සඳහා වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තාඹුගල ග්‍රාමයෙහි සමස්ථ පවුල් සංඛ්‍යාව අතුරින් 20%ක අහඹු නියැදියක් තෝරාගෙන ඒ අනුවග්‍රාමීය සේවා වියුක්තියට ස්වයං රැකියාව කෙබඳු බලපෑමක් සිදුකර තිබේදයන්නත්, තාඹුගල ග්‍රාමයෙහි පවතින ස්වයං රැකියා අවස්ථා මොනවාද යන්න හඳුනා ගැනීමත් ඊට අමතරව ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ කුටුම්භ ආදායමෙහි ස්වභාවය පිළිබඳව (අනෙක් රැකියාවලට සාපේක්ෂව)විමසා බැලීමත් මෙහි අරමුණු විය. පූර්ව ප්‍රශ්න මාලා ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික දත්තද පර්යේෂණය හා අදාළ පොත් පත්, සඟරා, වාර්ෂික වාර්තා ඇසුරෙන් ද්විතියික දත්ත ද යොදා ගෙන ඇත.දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කොට ඇත. මෙම අධ්‍යයනය තුළින් එළඹි නිගමනය වන්නේ 60%ක් පමණ ප්‍රමාණයක් තාඹුගල ග්‍රාමයෙහි ස්වයං රැකියාවල නියුතු බවයි. එහි වැඩි වශයෙන් ක්‍රියාත්මක වන ස්වයං රැකියා ලෙස කුකුළු පැටව් පාලනය, මැහුම් ගෙතුම්, ඉදල් කොසු නිර්මාණය, ගෙවතු වගා, මල් වැවීම, බිම්මල් වගාව, තේ වගාව හඳුනාගත හැකිවිය. එලෙසම, ස්වයං රැකියාවල නියුක්ත වන්නන්ගේ කුටුම්භ ආදායම අනෙකුත් රැකියාවල නියුතු වූවන්ගේ ආදායමට සාපේක්ෂව ඉහළ බවත් ස්වයං රැකියාව සේවා වියුක්තිය අවම කර ගැනීමට මනා පිටුවහලක් වී ඇති බවත් නිගමනය කළ හැක.

**මූඛ්‍ය පද**: ග්‍රාමීය අංශය, සේවා වියුක්තිය, ස්වයං රැකියාව

[1]සහකාර කථිකාචාර්ය , ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. thusha.hettiarachchi@gmail.com